දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பேக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல்முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையதளம் )
Website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல )DGHS/COVID-19/2020-347
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2021.01.11
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# MINISTRY OF HEALTH

සියලුම නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
අධ්‍යක්ෂ , ජාතික සෞඛ්‍ය විද්‍යායතනය
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී , කොළඹ මහ නගර සභාව
ප්‍රාදේශීය වසංගත වේධාංශ
සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්

**<u>නිරෝධායන හා රෝග වැළැක්වීමේ ආඥා පනත යටතේ COVID-19 වසංගතය තුළ සංචරණයන් සීමා කිරීම සහ ආයතන වසා දැමීම</u>**

1897 අංක 03 දරණ නිරෝධායන හා රෝග වැළැක්වීමේ ආඥා පනත මගින් රෝග පැතිරීම වැළැක්වීම සඳහා සංචරණයන් සීමා කිරීම සහ රෝගී පරිශ්‍රයක් ලෙස ප්‍රකාශ කිරීම පිළිබඳ විධිවිධාන නියම කර ඇත. COVID-19 පාලනය කිරීම සඳහා මෙම නීතිමය විධිවිධාන විද්‍යාත්මක පදනමකින් හා ප්‍රායෝගික ආකාරයකින් සිදුකල යුතුය.

ඇතැම් ප්‍රදේශවල පදනමක් රහිතව සංචරණ සීමා පනවා ඇති බවත් ආයතන වසා දැමීම සිදුකරන බවටත් මා වෙත වාර්තා වී ඇත. තවද මේ බව සාකච්ඡා මණ්ඩප/රැස්වීම්වලදී විවිධ පාර්ශවයන් විසින් මතුකර ඇත. මෙම තත්වය හේතුවෙන් සාමාන්‍ය ජනතාවට දුෂ්කරතාවයන්ට මුහුණදීමට සිදුවී තිබේ. මෙයට අමතරව එවැනි පදනමකින් තොරව සිදුකරනු ලබන ක්‍රියාමාර්ග මහජනතාවගේ විරෝධතා/ප්‍රතිරෝධයට තුඩු දෙන අතර COVID-19 රෝගය පාලනය කිරීම සඳහා අත්‍යවශ්‍ය මහජන සහයෝගය ලබා ගැනීම කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කරනු ලබන බවට අවධාරනය කරමි.

ඉහත කරුණු සලකා බැලීමේදී, සංචරණයන් සීමා කරන විට සහ ආයතන වසා දැමීමේදී පහත සඳහන් පරිදි ක්‍රියා කල යුතුය.

1. ප්‍රදේශයක COVID-19 සම්ප්‍රේෂණය වීමේ හැකියාවක් ඇති විට, ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (MOH) විසින් තත්ත්වය තක්සේරු කළ යුතුය.

2. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ/චක්‍රලේඛ/ලිපිවල සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින්, සංචරණ සීමා කිරීම / ආයතන වසා දැමීම සඳහා සැබෑ අවශ්‍යතාවයක් තිබේ නම්, ඒ බව ප්‍රාදේශීය වසංගත වේධාංශ සහ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතුය. එවැනි ඉල්ලීමක් සමග අදාල දත්ත සහිතවසාධාරණීකරණයක් ඉදිරිපත් කල යුතුය.

3. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශය තුළ සංචරණයන් සීමා කිරීම / ආයතන වසා දැමීම සඳහා කරන ඉල්ලීම් සම්බන්ධයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වගකිව යුතුය.

4. දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් තත්වය තක්සේරු කළ යුතු අතර, සංචරණයන් සීමා කිරීම (Lockdown) හෝ ආයතන වසා දැමීමේ අවශ්‍යතාවයක් තිබේ නම්, ඒ පිළිබඳව සාධාරණීකරණයක් සහිතව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල් වෙත ඉල්ලීමක් කළ යුතුය. තවද ඒ පිළිබඳව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක දැනුවත් කල යුතුය.

5. කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය සම්බන්ධයෙන් කොළඹ මහ නගර සභාවේ ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින්ද, කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනය අයත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ / ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ අධ්‍යක්ෂ විසින්ද, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ යුතුය.

6. සේවකයින් 50 ක් හෝ වැඩි ගණනක් සිටින සේවා ස්ථාන/ වැඩබිම් (Workplaces) වසා දැමීම සම්බන්ද ඉල්ලීම් අධ්‍යක්ෂ, පාරිසරික, වෘත්තීය සෞඛ්‍ය හා ආහාර සුරක්ෂිතතාව (විද්‍යුත් තැපැල: eohunit2020@gmail.com, ෆැක්ස්: 0112112704) වෙත ඉදිරිපත් කළ යුතුය. අධ්‍යක්ෂක විසින් එම ඉල්ලීම් වල කරුණු සලකා බලා තම නිර්දේශය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතුය. තවද කළමනාකාරිත්වය සේවා ස්ථාන/ වැඩබිම් තම අභිමතය පරිදි වසා දැමීමට තීරණය කළත් කිසිදු සේවා ස්ථානයක් දැමීම සඳහා අනුමැතිය ලබා නොදිය යුතු අතර ඒ සඳහා ඉහත දක්වා ඇති පරිදි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගත යුතුය.

7. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව කොවිඩ් 19 ඉහළ ව්‍යාප්තියක් සහිත දිස්ත්‍රික්කයක සිට පහල ව්‍යාප්තියක් සහිත දිස්ත්‍රික්කයකට ගමන් කිරීමේදී කිසිදු පුද්ගලයෙකු නිරෝධායනය නොකළ යුතුය.

8. 1897 අංක 03 දරණ නිරෝධායන හා රෝග වැළැක්වීමේ ආඥා පනත යටතේ සමස්ත ශ්‍රී ලංකාවට නිසි බලධරයා ලෙස සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් මතුව ඇති තත්වයන් සලකා බලා සංචරණයන් සීමා කිරීම, ආයතන වසා දැමීම සහ නිරෝධායනය පිළිබඳ ඉල්ලීම් සම්බන්ධ නියෝග නිකුත් කරනු ඇත.

ඉහත උපදෙස් අනුව කටයුතු කරන ලෙසටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව සංචරණයන් සීමා කිරීම, ආයතන වසා දැමීම සහ ප්‍රදේශයකින් ප්‍රදේශයකට යාමේදී පුද්ගලයින් නිරෝධායනය කිරීම සිදු නොකළ යුතු බවත් දන්වා සිටිමි.

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
නිසි බලධරයා

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

<u>පිටපත්:</u>
සියලුම ගරු පළාත් ආණ්ඩුකාරවරු
ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය
ලේකම්, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා / වෛද්‍ය සේවා)
සියලුම පළාත් සෞඛ්‍ය ලේකම්වරු
ප්‍රධානි, කොවිඩ් - 19 නිවාරණය කිරීමේ ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය
පොලිස්පති
අධ්‍යක්ෂ නිරෝධායන
ප්‍රධාන වසංගත වේදාඥ
අධ්‍යක්ෂ, පාරිසරික වෘත්තීය සෞඛ්‍ය හා ආහාර සුරක්ෂිතතා
අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය